

# බීජ ගබඩා කිරීම සඳහා උපදෙස්

බීජ මගින් ප්‍රචාරණය වන බෝග වගා කිරීමේදී මූලිකව අවශ්‍ය වනුයේ උසස් පැළවීමේ ශක්තියකින් යුත් දිරිමත් බීජ වේ. මෙම බීජ වල ගුණාත්මය මත වගාවේ සාර්ථකත්වය රඳා පවතී.

බීජ වල ගුණාත්මය රඳ පවතිනුයේ, බීජ වැපිරීමේ සිට අස්වනු නෙළා ගන්නා තෙක් සහ අස්වනු සකසා ගබඩා කර නැවත සිටුවීමට යොදාගන්නා තෙක් බීජයේ හා අවට පරිසරයේ සිදුවනු ලබන ක්‍රියාකාරකම් වල බලපෑම අනුවයි. එම නිසා බීජ නිෂ්පාදනය මෙන්ම ලබාගත් අස්වැන්න ක්‍රමවත්ව ගබඩා කිරීම ද ගුණාත්මක බීජ නිෂ්පාදන වැඩ පිළිවෙලක වැදගත් කාර්‍යයක් වේ.එහෙත් බොහෝ ගොවි මහතුන් විසින් වගා කටයුතු විශාල මහන්සියකින් හා පරීක්ෂාකාරීව සිදු කළද ලබාගත් අස්වැන්න සකසා ගබඩා කිරීම සුදුසු පරිදි නොකරන නිසා එම බීජ වල පැළවීමේ ශක්තිය ඉක්මනින් හීන වී යයි. තවද නිවර්තන කලාපීය රටක් වන ශ්‍රී ලංකාවේ පවතින බීජ ගබඩා කිරීමට කිසිසේත් සුදුසු නොවන අධික පරිසර උෂ්ණත්ව හා ආර්ද්‍රතා තත්ත්ව පවතින නිසා ගබඩා කරන ලද බීජ වල ජීව්‍යතාවය රැකගැනීම තවදුරටත් අසීරු වී ඇත.

එම නිසා අස්වනු නෙළන අවස්ථාවේ සිට නැවත වගා කිරීමට යොදා ගන්නා අවස්ථාව දක්වා ගුණාත්මය ආරක්ෂා වන පරිදි බීජ ගබඩා කර තබා ගැනීම අතිශයින් වැදගත්ය.

## ගබඩා කිරීම සඳහා බීජ සූදානම් කිරීම :

» බීජ හොඳින් පිරිසිදු කරන්න. සුළං කිරීම මගින් හා සල්ලඩ යොදා ගෙන වල් ඇට, අපද්‍රව්‍ය, ගල්, වැලි, බීජ කැබලි හා පොතු ආදිය ඉවත් කරන්න.
» පිරිසිදු කර ගත් බීජ ඉතා හොඳින් වියලා පිරිසිදු මලු වලට දමන්න.
» වරක් භාවිතා කළ ඇසුරුම් (ගෝනි ආදිය) යොදා ගන්නේ නම් ඒවා හොඳින් පිරිසිදු කර ගන්න.

## බීජ දැමීම සඳහා ගබඩාව සූදානම් කර ගැනීම :

- ගබඩාව අවට පරිසරය හොඳින් පිරිසිදු කර ගන්න. අවට ඇති තණකොළ ආදියද කපා දමන්න.
- ගොඩනැගිල්ල ආසන්නයේ ඇති ගස් වල අතු ද කපා ඉවත් කරන්න.
- ගබඩාව ඇතුළත ඇති අපද්‍රව්‍ය, දූවිලි, ධාන්‍ය කැබලි ආදිය ඉවත් කර පුලුස්සා දමන්න.
- වර්ෂාවෙන් බීජ ආරක්ෂා කර ගැනීම සඳහා ගබඩාවේ වහලය හොඳින් සෙවිලි කරන්න.
- සිමෙන්ති, මැටි, හෝ හුණු බදාම යොදාගෙන ගබඩාවේ බිත්ති වල හා පොළවේ ඇති සියලුම සිදුරු වසා දමන්න.
- ගබඩාව ඇතුළත හා පිටත සුදු පාට හුණු හෝ තීන්ත ආලේප කිරීම වඩා සුදුසුය. සුදු වර්ණය මගින් තාපය උරා නොගනී. එනිසා ගබඩාව තුළ අනවශ්‍ය පරිදි උෂ්ණත්වය ඉහළයාම වළකී.
- ගබඩාවට සුළං ඒමට ඇති කවුළු සියල්ල කම්බි දැල් වලින් වසන්න.
- බීජ මලු තැබීමට යොදා ගන්න ලී රාමු හා ලී දඬු ආදියද ඉතා හොඳින් පිරිසිදු කරන්න.
- මී ගුල් ආදිය තිබේ දැයි පරීක්ෂාකර බලා වසා දමන්න

## ගබඩා කර ඇති බීජ වල ගුණාත්මය අඩුවීමට හේතු වන සාධක :

### අධික උෂ්ණත්වය

- ගබඩාව තුළ උෂ්ණත්වය වැඩිවීම. ගබඩා කර ඇති බීජ ශ්වසනය කිරීම නිසා නිපදවන තාපය මගින් වායු සංසරණය දුර්වල වූ විට ගබඩාව තුළ උෂ්ණත්වය ඉහළ යයි.

### අධික තෙතමනය

- වායුගෝලයේ ඇති ජල වාෂ්ප උරා ගැනීමෙන් හෝ බීජ උර කෙළින්ම පොළව මත තැන්පත් කළවිට පොළවෙන් ජලය උරා ගැනීමෙන්, බීජවල තෙතමන ප්‍රමාණය වැඩිවේ. එවිට බීජ වල ජීව්‍යතාවය ආරක්ෂා වන පරිදි ගබඩා කර තබාගත හැකි කාලයද අඩු වේ.

### ක්ෂුද්‍ර ජීවීන්

- දිලීර වැනි ක්ෂුද්‍ර ජීවී ආසාධන නිසා බීජවල ගුණාත්මය බාල වේ. විශේෂයෙන් බීජවල තෙතමනය වැඩි අවස්ථාවන්හිදී දිලීර (පුස්) ආසාධනය වැඩිවේ.
- තවද මීයන් හා කුරුල්ලන් විසින් බීජ ආහාරයට ගැනීමෙන් පසු අපද්‍රව්‍ය බීජ සමග කළවම් වීමෙන් ද බීජ වල ගුණාත්මය බාල වේ.

## ගබඩා නඩත්තු කිරීම :

- බීජ වලට හොඳින් වාතාශ්‍රය ලැබෙන පරිදි කාලගුණය යහපත් සෑම විටකදීම ගබඩාවේ සුළං කවුළු විවෘත කර තබන්න.
- වැසි දින වලදී ගබඩාව තුළට ජල වාෂ්ප ඇතුළු වීම වැළැක්වීම සඳහා සුළං කවුළු වසා තබන්න.
- කෘමීන්ගෙන් හානි සිදුවී තිබේද යන්න දැන ගැනීම සඳහා දිනපතාම පාහේ ගබඩාව පරීක්ෂා කරන්න.
- ගබඩාව තුළ වැටී ඇති බීජ ඇතුළු අනෙකුත් අපද්‍රව්‍ය ඉවත් කර ගබඩාවේ පොළව ඉතා පිරිසිදුව තබා ගන්න.
- සෑම විටම ගබඩාව තුළ මනා වාතාශ්‍රයක් පවතින පරිදි සිසිල්ව තබා ගැනීමට උත්සාහ කරන්න.

» සෑම විටම ලී කොට හෝ ලී රාමු මත පමණක් බීජ උර ගබඩා කරන්න.

» බිත්ති වල ගැටෙන පරිදි බීජ ගබඩා කිරීමෙන් වළකින්න.

## බීජ ගබඩා වල කෘමි පාලනය :

» වරින් වර බීජ තොග පරීක්ෂා කර බලා කෘමි හානි දක්නට ලැබෙන තොග තිබේ නම් ඒවා පිටතට ගෙන නැවත ශුද්ධ කර වියළා ගබඩා කරන්න.

» ගබඩාව තුළ පියාඹන කෘමීන් සිටීද යන්න පිළිබඳව හැමවිටම පරීක්ෂාවෙන් සිටින්න.

» කෘමි හානි පාලනය කර ගැනීම අපහසු අවස්ථා වලදී පමණක් නිර්දේශිත ක්‍රමයෙන් භාවිතා කරන්න.

## මීයන් මර්ධනය :

» ජලය නොමැතිව මීයන්ට ජීවත් විය නොහැකිය. ජලය සොයා මීයන් හට ගබඩාවෙන් පිටතට ගමන් කිරීමට සිදුවේ. මෙ නිසා ගබඩාවට මීයන් ඇතුල් වන ස්ථාන අවහිර කිරීමෙන් ඔවුන් සාර්ථකව මර්ධනය කළ හැකිය.


උපුටා ගෙන සැකසුම -

ඩබ්. ඩබ්. ඒ. ඩී. තමරා

කෘෂිකර්ම උපදේශිකා

බීජ පරීක්ෂණාගාරය

බටඅත



කෘෂිකාර්මික ශ්වේත විප්ලවයක් කරා යන ගමනේ ගොවි කාන්තා දෑතින් නිමවුන අහරක

"සැබෑ ශ්‍රී ලාංකේය රසය" විඳින්නට

ඔබත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෙල බොජුන් හල් වෙත පියනගන්න

පිහිටා ඇති ස්ථාන :

ගන්නෝරුව, පේරාදෙණිය (පරණ ගලහ පාර), මහනුවර (නාගරික රථගාල ඉහල මාලය), කුණ්ඩසාලේ, පැල්වෙහෙර, පුලියන්කුලම, බත්තරමුල්ල , බටාඅත, ලබුදූව


